IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2015/2016**

**(ප්‍රථම සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2017 දෙසැම්බර්)**

# BLE 201 - සාර්ව ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

1. ප්‍රශ්න (04) කට පමණක් පිළිතුරු සැපයිය යුතුයි..
2. කාලය පැය තුනයි (03)
3. මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.
4. ගණක යන්ත්‍ර භාවිත කළ හැක.
5. පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.
6. ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. i. සාර්ව ආර්ථික විද්‍යාව සූක්ෂම ආර්ථික විද්‍යාවෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. සාර්ව ආර්ථික විද්‍යාවේ සහ සූක්ෂම ආර්ථික විද්‍යාවේ ප්‍රයෝජන හඳුනාගෙන ඒවා වඩාත් වැදගත් වන්නේ කුමන පාර්ශවයන්ට දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. මූලික සාර්ව ආර්ථික අරමුණු මොනවාද? එම සාර්ව ආර්ථික අරමුණු අතර ඇති සම්බන්ධතාවයන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

02. අංශ හතරක් සහිත කල්පිත ආර්ථිකයකට අදාල පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත. (සියළුම මූල්‍යමය අගයන් රුපියල් දහස් ඒකක වලින් බව සැලකිල්ලට ගන්න)

| | | |
|---|---|---|
| ස්වායත්ත පාරිභෝජනය | = | 380 |
| ආන්තික පරිභෝජන නැම්යාව | = | 0.8 |
| ආයෝජනය | = | 300 |
| රාජ්‍ය වියදම | = | 500 |
| අපනයන | = | 400 |
| ස්වායත්ත ආනයන | = | 300 |
| ආන්තික ආනයන නැම්යාව | = | 0.2 |
| ස්වායත්ත බදු | = | 100 |
| ආන්තික බදු නැම්යාව | = | 0.1 |

i. ඉහත තොරතුරු භාවිතයෙන් මෙම ආර්ථිකයට අදාල සමස්ත ඉල්ලුම් ශ්‍රිතය ලබාගන්න.

(ලකුණු 05)

ii. සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 05)

iii. ආයෝජන ගුණකය ගණනය කොට එය අර්ථකතනය කරන්න. ජාතික ආදායම තවත් 500 කින් ඉහළ දැමීමට නම් දැනට පවතින ආයෝජන කෙසේ වෙනස් විය යුතු දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. මෙම ආර්ථිකයට අදාල වෙළඳ ශේෂය ගණනය කරන්න.

(ලකුණු 05)

v. මෙම ආර්ථිකයට අදාල අයවැය පරතරය ගණනය කොට එය පියවා ගැනීමට අවශ්‍ය කරන යෝජනා මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 25)

03. ඉහත ප්‍රශ්න අංක දෙකට අදාල තොරතුරුවලට අමතර වශයෙන් පහත සඳහන් තොරතුරු ද ඔබට සපයා ඇතැයි සිතන්න. (සියළුම මූල්‍ය වටිනාකම් රු. දහස් ඒකක වලිනි)

| | | |
|---|---|---|
| ආයෝජනයේ පොලී නම්‍යතාවය | = | 10 |
| ගණුදෙනු චේතනාවෙන් මුදලට කෙරෙන ඉල්ලුම | = | 0.2 |
| සමපේක්ෂණ චේතනාවෙන් මුදලට කෙරෙන ඉල්ලුම | = | 20 |
| මූර්ත මුදල් සැපයුම | = | 400 |

i. ආර්ථිකයට අදාල IS සහ LM සමීකරණ ලබා ගන්න

(ලකුණු 10)

ii. සමතුලිත ජාතික ආදායම සහ පොළී අනුපාතය ගණනය කරන්න.

(ලකුණු 10)

iii. ඉහත ඔබ ලබාගත් තොරතුරු ප්‍රස්ථාරගත කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 25)

04. ප්‍රසාරනාත්මක අයවැය ප්‍රතිපත්තියක සාර්ථකභාවය IS සහ LM වක්‍රවල බෑවුම් මත වෙනස්විය හැකිබව සුදුසු ප්‍රස්ථාර භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 25)

05. ප්‍රසාරනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක සාර්ථකභාවය IS සහ LM වක්‍රවල බෑවුම මත වෙනස්විය හැකි බව සුදුසු ප්‍රස්ථාර භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 25)

06. i. අන්තර්ජාතික වෙළඳාම තුළින් සෑම හවුල්කාර රටකටම වාසි අත්පත් කරගත හැකි බව අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ නිරපේක්ෂ වාසි න්‍යාය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. අන්තර්ජාතික වෙළඳාම තුළින් සෑම හවුල්කාර රටකටම වාසි අත්පත් කරගත හැකි බව අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සාපේක්ෂ වාසි න්‍යාය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. අන්තර්ජාතික වෙළඳාම පැහැදිලි කිරීමේදී ඉහත න්‍යායන් දෙකට අදාල දුර්වලතාවයන් වෙන වෙනම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 25)

* * * * *